# වෙළෙඳාම සහ සංචාරක කර්මාන්තය

අපනයනයන්හි දක්නට ලැබුණු මන්දගාමී වර්ධනයත්, ආනයනයන්හි සිදුවූ විශාල ඉහළ නැගීමත් හේතුකොටගෙන වෙළෙඳ ගිණුමෙහි ශේෂය සැළකිය යුතු ලෙස පහත වැටුන අතර 1991 වසරේ විදේශීය වෙළෙඳ අංශයේ ක්‍රියාකාරිත්වය අවාසිදායක විය. මෙම ප්‍රවනතාවය අඛණ්ඩව වෙළෙඳ ශේෂයේ යහපත් තත්ත්වයක් පෙන්නුම් කල පසුගිය වසර තුනෙහි දක්නට ලැබුන තත්ත්වයට වඩා ඉඳුරාම වෙනස්ය. 1990 වසරේ වූ සියයට 20 ක කැපීපෙනෙන වර්ධනය හා සසඳන කල 1991 වර්ෂයේ වෙළෙඳ භාණ්ඩ අපනයනය විගැහි වටිනාකම් අනුව සියයට දෙකක සුළු වැඩිවීමක් පෙන්විය. මේ අතර, 1990 වසරේ සියයට 14 ක් වූ ආනයන වියදමේ වර්ධනය හා සසඳන කල 1991 වසරේදී එය සියයට 13 ක් විය. ඒ අනුව විගැහි දශ ලක්ෂ 519 ක් වූ 1990 වසරේ වෙළෙඳ ගිණුමේ හිඟය විගැහි දශ ලක්ෂ 747 දක්වා 1991 වසරේදී සියයට 48 කින් පහත වැටුණි. මෙම වසර දෙක අතර අපනයන ඉපැයීම් ආනයන වියදම්වල අනුපාතයක් වශයෙන් ගත් කළ සියයට 74 සිට සියයට 66 දක්වා පහත වැටුණි.

අපනයනයන්හි බලාපොරොත්තු බිඳ වැටෙන සුළු ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ තේ මිළ පහත වැටීම, ඇඟළුම් හැර වෙනත් කාර්මික නිෂ්පාදන බලාපොරොත්තු වූ පරිදි වැඩි නොවීම සහ මැණික් හා දියමන්ති අපනයනයන්ගේ සීඝ්‍ර පහත වැටීමය. අපනයන නිෂ්පාදිත සඳහා වූ විදේශ ඉල්ලුම කාර්මික රටවල තිබූ ආර්ථික අවපාත තත්ත්වයන් නිසා සාමාන්‍යයෙන් පහත මට්ටමක පැවතුණි. මීට අමතරව ඉරාකයට වෙළෙඳපොළට ඇතුල්වීමේ නොහැකියාව හා නැගෙනහිර යුරෝපා රටවල් හා රුසියාව අඩු වශයෙන් මිළදී ගැනීම, රබර් හා තේ වෙළෙඳපොළට විශේෂයෙන් බලපෑවේය. 1991 වර්ෂයේ වැවිලි කර්මාන්ත අංශයේ මුළු අපනයන ඉපැයීම් සියයට 13 කින් අඩුවිය. 1991 වර්ෂයේ ඛණිජ තෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති සහ වෙනත් ඛණිජ නිෂ්පාදිත වලින් ලද අපනයන ඉපැයීම් ද පිළිවෙලින් සියයට 21 කින්, සියයට 22 කින්, සියයට 23 කින් සහ සියයට 60 කින් පහත වැටුණි. කෙසේ වුවද රෙදිපිළි හා ඇඟළුම්, වෙනත් කාර්මික නිෂ්පාදිත හා සුළු අපනයන භෝගයන්හි වැඩිවූ ආදායමක් වාර්තා වූ අතර, වර්ෂයේ සමස්ත අපනයන ආදායමේ සුළු වර්ධනයක් පෙන්වීමට මෙය දායක විය. ආර්ථිකයේ ද්‍රවශීලතාවය ඉහළ මට්ටමක පැවතුන බැවින්ද වැඩිවූ ආයෝජන කටයුතු නිසාද ආනයනයන් සඳහා වූ ඉල්ලුම ඉහළ මට්ටමක පැවතුණි.

**1.37 සංඛ්‍යා සටහන**

**විදේශීය වෙළෙඳාමෙහි ක්‍රියාකාරීත්වය 1989 - 1991**

| වර්ෂය | වර්ධන අනුපාතිකය | | වෙළෙඳ දර්ශක 1985 = 100 | | අනුපාතය | |
|---|---|---|---|---|---|---|
| | අපනයන | ආනයන | අපනයන මිළ | ආනයන මිළ | වෙළෙඳ අනුපාතය | අපනයන/ ආනයන |
| 1989 . . | 10.7 | 4.6 | 150.7 | 164.8 | 91.4 | 0.70 |
| 1990 . . | 20.1 | 14.0 | 183.0 | 209.4 | 87.4 | 0.74 |
| 1991(අ) . . | 2.0 | 13.0 | 186.4 | 217.5 | 85.7 | 0.67 |

(අ) තාවකාලික.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව:
ශ්‍රී ලංකා මහ බැංකුව.

තාවකාලික රේගු සංඛ්‍යා අනුව 1991 වසරේ ආනයන වියදම විගැහි දශ ලක්ෂ 2,258 ක් (රුපියල් දශ ලක්ෂ 127,831) වූ අතර අපනයන ඉපැයීම් විගැහි දශ ලක්ෂ 1,453 ක් (රුපියල් දශ ලක්ෂ 82,225) ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1991 වර්ෂයේ වෙළෙඳ හිඟය විගැහි දශ ලක්ෂ 806 ක් (රුපියල් දශ ලක්ෂ 45,606) විය. කෙසේ වුවද, රේගු සංඛ්‍යා වාර්තා කිරීමේදී ඇතිවන කල්

## 1.38 සංඛ්‍යා සටහන

### අපනයන, ආනයන සහ වෙළෙඳ තුලනය 1980 - 1991

රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| වර්ෂය | රේගු සංඛ්‍යා | | | ගලපන ලද සංඛ්‍යා | | |
|---|---|---|---|---|---|---|
| | අපනයන (අ) නැ. වි. ස. | ආනයන (ආ) මි. ර. ගැ. | වෙළෙඳ තුලනය | අපනයන | ආනයන | වෙළෙඳ තුලනය |
| 1980 | 17,388<br>(808) | 33,637<br>(1,563) | -16,249<br>(-755) | 17,595<br>(818) | 33,942<br>(1,577) | -16,347<br>(-760) |
| 1981 | 20,199<br>(891) | 35,530<br>(1,567) | -15,331<br>(-676) | 21,043<br>(928) | 36,583<br>(1,614) | -15,540<br>(-686) |
| 1982 | 21,124<br>(919) | 36,876<br>(1,605) | -15,751<br>(-686) | 21,454<br>(934) | 41,946<br>(1,826) | -20,492<br>(-892) |
| 1983 | 25,183<br>(1,001) | 42,021<br>(1,670) | -16,838<br>(-669) | 25,096<br>(998) | 45,558<br>(1,811) | -20,461<br>(-813) |
| 1984 | 37,006<br>(1,419) | 46,913<br>(1,799) | -9,908<br>(-380) | 37,347<br>(1,432) | 47,541<br>(1,823) | -10,194<br>(-391) |
| 1985 | 35,035<br>(1,268) | 49,069<br>(1,776) | -14,034<br>(-508) | 36,207<br>(1,311) | 54,049<br>(1,956) | -17,843<br>(-646) |
| 1986 | 34,092<br>(1,036) | 51,282<br>(1,559) | -17,189<br>(-523) | 34,072<br>(1,036) | 54,559<br>(1,658) | -20,487<br>(-623) |
| 1987 | 39,861<br>(1,046) | 59,750<br>(1,568) | -19,889<br>(-522) | 41,133<br>(1,080) | 60,528<br>(1,589) | -19,396<br>(-509) |
| 1988 | 47,092<br>(1,101) | 70,320<br>(1,645) | -23,228<br>(-543) | 46,928<br>(1,098) | 71,030<br>(1,661) | -24,102<br>(-564) |
| 1989 | 55,511<br>(1,202) | 75,353<br>(1,631) | -19,842<br>(-430) | 56,175<br>(1,216) | 80,225<br>(1,737) | -24,050<br>(-521) |
| 1990 | 76,624<br>(1,408) | 105,559<br>(1,940) | -28,936<br>(-532) | 79,481<br>(1,461) | 107,729<br>(1,980) | -28,248<br>(-519) |
| 1991 | 82,225<br>(1,453) | 127,831<br>(2,258) | -45,606<br>(-806) | 84,378<br>(1,491) | 126,643<br>(2,237) | -42,264<br>(-747) |

(අ) ප්‍රති අපනයන වටිනාකම ඇතුළත්ය.
(ආ) සත රන් හා කාසි ඇතුළත් නොවේ.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව:
ශ්‍රී ලංකා මහ බැංකුව.

පරිවර්තනතාව : 1990 - විගැහි 1 - රු. 54.4216
1991 - විගැහි 1 - රු. 56.6101

පමාවීම සහ අනෙකුත් සාධක වලට ගැලපීම් කළපසු මුළු ආනයන වටිනාකම විගැහි දශ ලක්ෂ 2,237 ක් (රුපියල් දශ ලක්ෂ 126,643) වූ අතර අපනයන වටිනාකම විගැහි දශ ලක්ෂ 1,491 (රුපියල් දශ ලක්ෂ 84,378) විය. මෙසේ ගලපන ලද සංඛ්‍යාවලට අනුව, 1990 විගැහි දශ ලක්ෂ 519 ක (රුපියල් දශ ලක්ෂ 28,248) වෙළෙඳ හිඟය හා සසඳා බලන කල 1991 දී විගැහි දශ ලක්ෂ 747 ක (රුපියල් දශ ලක්ෂ 42,264) වෙළෙඳ හිඟයක් පිළිබිඹු විය.

පොල් නිෂ්පාදිත, රෙදිපිළි සහ ඇඟළුම්, අගනා සහ අර්ධ අගනා ගල් හැර අනිකුත් අපනයන සම්බන්ධයෙන් වූ සාමාන්‍ය මිළ ගණන් 1990 වසර හා සසඳන කළ 1991 වසරේදී වාසිදයක නොවිය. කාර්මික නිෂ්පාදිත අපනයන මිළ සියයට 10.0 කින්ද, ඛණිජ ද්‍රව්‍ය අපනයන මිළ සියයට 5.3 කින්ද, ඉහළ යාමේ සහ කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන මිළ සියයට 3.8 කින් පහළ වැටීමේ සමුච්චිත ප්‍රතිඵලයක් ලෙස සමස්ත අපනයන මිළ දර්ශකය රුපියල් වටිනාකම් අනුව සියයට 1.9 කින් ඉහළ නැගුණි. මේ අතර, ඛණිජ තෙල් නිෂ්පාදිත, රසායන ද්‍රව්‍ය සහ තිරිඟු ආනයනවල සාමාන්‍ය මිළ පහළ වැටීම බොහෝ දුරට සමහන් කරමින් ප්‍රවාහන උපකරණ, පොහොර සහ රෙදිපිළි හා ඇඳුම්වල සාමාන්‍ය මිළ ඉහළ නැගුණි. පරිභෝජන භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ මිළ අනුපිළිවෙලින් සියයට 3.8 කින් සහ සියයට 10.2 කින් පහත වැටීමේ සහ අන්තර් භාණ්ඩවල සාමාන්‍ය මිළ සියයට 2.2 කින් පහත වැටීමේ සමුච්චිත ප්‍රතිඵලයක් ලෙස සමස්ත ආනයන මිළ දර්ශකය රුපියල් වටිනාකම් අනුව සියයට 3.9 කින් පහත වැටුණි. මෙම මිළ දර්ශකයන්හි වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස 1991 වසරේ වෙළෙඳ අනුපාතය සියයට 1.9 ක සුළු පහත වැටීමක් පෙන්නුම් කළේය.

**අපනයන**

ගලපන ලද රේගු සංඛ්‍යාවලට අනුව, 1990 විගැහි දශ ලක්ෂ 1,461 ක් (රුපියල් දශ ලක්ෂ 79,481) වූ මුළු අපනයන ඉපැයීම් 1991 දී සියයට 2 ක වර්ධනයක් වාර්තා කරමින් විගැහි දශ ලක්ෂ 1,491 (රුපියල් දශ ලක්ෂ 84,378) දක්වා වැඩිවිය. කාර්මික අපනයන ආදායම ඉහළ යාම තුලින් ඇතිවූ යහපත් බලපෑම්ද අභිබවමින් කෘෂිකාර්මික හා ඛණිජ අපනයන ආදායම්වල පහත වැටීම අපනයන ක්ෂෙත්‍රයේ වර්ධනය බලවත් ලෙස දුර්වල කරවිය. 1990 සියයට 24 ක සිත්ගන්නා සුළු වර්ධනය හා සසඳන කල කාර්මික අපනයන සියයට 17 කින් වර්ධනය විය. කාර්මික නිෂ්පාදනයන්ගේ ප්‍රසාරණයට විශේෂයෙන්ම හේතු වූයේ රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන්ගේ සිදුවූ සියයට 27ක වර්ධනයකි. මේ අතර, ඛණිජ අපනයනයන්ගෙන් ලත් ආදායම සියයට 30 කින් සැලකිය යුතු අන්දමින් පහත වැටුන අතර 1990 වර්ෂයේදී මෙය සියයට 10 ක වර්ධනයක් පෙන්විය. මේ හා සමාන ප්‍රවනතාවයක් පෙන්වමින් 1990 සියයට 11 කින් වර්ධනය වූ කෘෂිකාර්මික අපනයනයන්ගෙන් ලත් ඉපැයීම් 1991 දී සියයට 12 කින් පහත වැටුණි.

කාර්මික අපනයන අංශයෙන් වූ දායකත්වය 1990 වර්ෂයේ සියයට 52 සිට 1991 වර්ෂයේ සියයට 60 දක්වා වැඩිවෙමින් එය ප්‍රධාන අපනයන අංශය වශයෙන් අඛණ්ඩව පැවතුණි. මෙයට ප්‍රතිවිරුද්ධව 1977 වර්ෂයේ මුළු අපනයන ඉපයීම්වලින් හතරෙන් තුනක් වූ කෘෂිකාර්මික අපනයනයන්ගේ දායකත්වය 1990 වර්ෂයේ සියයට 36 සිට 1991 වර්ෂයේ සියයට 31 දක්වා තවදුරටත් පහත වැටුණි. මෙම දෙවර්ෂය තුලදී ඛණිජ අපනයනයන්ගේ දායකත්වයද සියයට 4 සිට සියයට 3 දක්වා පහත වැටුණි. අයිතමයක් වශයෙන් ගත්කළ 1986 දී විශාලතම අපනයන භාණ්ඩය වූ රෙදිපිළි හා ඇඟළුම්වල දායකත්වය 1990 සියයට 32 සිට 1991 සියයට 39 දක්වා වැඩිවෙමින් තවදුරටත් ප්‍රධාන අපනයන භාණ්ඩ වර්ගය වශයෙන් පැවතුණි.

**තේ**

1991 දී මුළු අපනයන වලින් සියයට 21 ක ප්‍රමාණයකට දායක වෙමින් තේ තවදුරටත් ප්‍රධාන කෘෂිකාර්මික අපනයන නිෂ්පාදිතය වශයෙන් පැවතුණි. අපනයන ප්‍රමාණය සහ මිළ යන දෙකෙහිම අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් තේ අපනයන වටිනාකම 1990 විගැහි දශ ලක්ෂ 364 (රුපියල් දශ

**1.39 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය 1989 - 1991**

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු අපනයන වල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1991 (ඈ) | 1989 | 1990 | 1991 | 1989 | 1990 | 1991 |
| 1. කෘෂිකාර්මික අපනයන | 22,049 | 28,886 | 26,537 | 477 | 531 | 469 | 39.2 | 36.3 | 31.5 |
| 1.1 තේ | 13,664 | 19,823 | 17,867 | 296 | 364 | 316 | 24.3 | 24.9 | 21.2 |
| 1.2 රබර් | 3,112 | 3,080 | 2,641 | 67 | 57 | 47 | 5.5 | 3.9 | 3.1 |
| 1.3 පොල් | 2,865 | 2,783 | 2,619 | 62 | 51 | 46 | 5.1 | 3.5 | 3.1 |
| 1.3.1 පොල් මද නිෂ්පාදිත | 1,920 | 1,842 | 1,769 | 42 | 34 | 31 | 3.4 | 2.3 | 2.1 |
| 1.3.2 වෙනත් | 945 | 941 | 850 | 20 | 17 | 15 | 1.7 | 1.2 | 1.0 |
| 1.4 සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතය (අ) | 2,408 | 3,199 | 3,409 | 52 | 59 | 60 | 4.3 | 4.0 | 4.1 |
| 2. කාර්මික අපනයන (අ) (ආ) | 28,470 | 41,510 | 50,736 | 616 | 763 | 896 | 50.7 | 52.2 | 60.1 |
| 2.1 රෙදිපිළි හා ඇඟළුම් | 17,631 | 25,163 | 33,261 | 382 | 462 | 588 | 31.4 | 31.6 | 39.4 |
| 2.2 ඛනිජ තෙල් නිෂ්පාදිත | 2,242 | 3,974 | 3,289 | 49 | 73 | 58 | 4.0 | 5.0 | 3.9 |
| 2.3 වෙනත් | 8,597 | 12,374 | 14,185 | 186 | 227 | 250 | 15.3 | 15.5 | 16.8 |
| 3. ඛණිජමය අපනයන | 2,693 | 3,484 | 2,562 | 58 | 64 | 45 | 4.8 | 4.4 | 3.0 |
| 3.1 මැණික් | 2,204 | 2,933 | 2,358 | 48 | 54 | 42 | 3.9 | 3.7 | 2.8 |
| 3,2 වෙනත් | 489 | 551 | 204 | 11 | 10 | 4 | 0.9 | 0.7 | 0.2 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ) | 2,963(ඉ) | 5,601 | 4,543 | 64 | 103 | 80 | 5.3 | 7.1 | 5.4 |
| මුළු අපනයන (ආ) | 56,175 | 79,481 | 84,378 | 1,216 | 1,461 | 1,491 | 100.0 | 100.0 | 100.0 |

(අ) තෝරාගත් අයිතමයන්.
(ආ) ගලපන ලදී.
(ඇ) ප්‍රති අපනයන ඇතුළත්ය.
(ඈ) තාවකාලික.
(ඉ) නෞකාවත් අපනයනය ඇතුළත්ය.

පරිවර්තනතාවය : 1989 - විගැහි 1 = රුපියල් = 46.1874
1990 - විගැහි 1 = රුපියල් = 54.4216
1991 - විගැහි 1 = රුපියල් = 56.6101

මූලයන් : ශ්‍රී ලංකා රේගුව:
ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව:
ශ්‍රී ලංකා මහ බැංකුව.

ලක්ෂ 19,823) සිට 1991 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 316 (රුපියල් දශ ලක්ෂ 17,867) දක්වා සියයට 13 කින් පහත වැටුණි. නිෂ්පාදනය වැඩි වුවද තේ අපනයන ප්‍රමාණය 1990 වර්ෂයේ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 216 සිට 1991 වර්ෂයේ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 212 දක්වා සියයට 2 කින් පහත වැටුණි. මේ අතර මෙම දෙවර්ෂය තුලදී තේ වල සාමාන්‍ය අපනයන මිළ කිලෝ ග්‍රෑමයට විගැහි 1.69 (කිලෝ ග්‍රෑමයට රුපියල් 91.78) සිට කිලෝ ග්‍රෑමයට විගැහි 1.49 (කිලෝග්‍රෑමයට රුපියල් 84.12) දක්වා පහත වැටුණි. තේ මිළ පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ලෝක සැපයුම වැඩිවීම, කාර්මික රටවල ආර්ථික අවපාත තත්ත්වයන් නිසා ඉල්ලුම පහළයාම සහ ඉරාකය, නැගෙනහිර යුරෝපා රටවලින් සහ රුසියාවෙන් අඩු වශයෙන් තේ මිළදී ගැනීම වැනි කරුණුය.

## රබර්

රබර් අපනයන මිළ සහ ප්‍රමාණය යන දෙකෙහිම පහත වැටීම නිසා රබර් අපනයන වටිනාකම 1990 විගැහි දශ ලක්ෂ 57 (රුපියල් දශ ලක්ෂ 3,080) සිට 1991 විගැහි දශ ලක්ෂ 47 (රුපියල් දශ ලක්ෂ 2,641) දක්වා සියයට 18 කින් පහත වැටුණි. රබර් අපනයන ප්‍රමාණය 1990 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 87 සිට 1991 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 76 දක්වා සියයට 13 කින් පහත වැටුණ අතර සාමාන්‍ය අපනයන මිළද 1990 දී කිලෝ ග්‍රෑමයට විගැහි 0.65 (කිලෝ ග්‍රෑමයට රු.35.50) සිට 1991 දී කිලෝ ග්‍රෑමයට විගැහි 0.61 (කිලෝ ග්‍රෑමයට රු.34.57) දක්වා සියයට 6 කින් පහත වැටුණි. කාර්මික රටවල ඇති වූ ආර්ථික අවපාතය නිසා මෝටර් රථ කර්මාන්තයේ වර්ධනය අඩාල වූයෙන් ලෝක ඉල්ලුම දුර්වල වූ අතර එය ස්වභාවික රබර් සඳහා වූ වෙළෙඳපොළ කෙරෙහි බලපෑවේය. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදයික ගැනුම්කරුවන් වන නැගෙනහිර යුරෝපයේ ඇතැම් රටවල සිදුවූ දේශපාලන වෙනස්වීම් සමඟ ඇතිවූ ආර්ථික ප්‍රශ්න හේතුවෙන් මේ තත්ත්වය තවත් බැරෑරුම් විය. මුළු රබර් අපනයන ඉපැයීම් වලින් ෂීට් රබර් සියයට 49 කට දායක වූ අතර ලේටෙක්ස් ක්‍රේප් සියයට 34 කට දායක විය. ස්ක්‍රැප් ක්‍රේප් සහ සෝල් ක්‍රේප් දයකත්වය, පිළිවෙලින් සියයට 12 ක් සහ සියයට 4 ක් බැගින් විය.

## පොල්

අපනයන ප්‍රමාණය ගෙඩි දශ ලක්ෂ 508 සිට ගෙඩි දශ ලක්ෂ 367 දක්වා සැලකියයුතු අන්දමින් පහත වැටීම නිසා පොල් නිෂ්පාදිත අපනයන වලින් ලද මුළු ඉපැයීම් 1990 විගැහි දශ ලක්ෂ 51 සිට (රුපියල් දශ ලක්ෂ 2,733) 1991 විගැහි දශ ලක්ෂ 46 (රුපියල් දශ ලක්ෂ 2,619) දක්වා සියයට 10 කින් පහත වැටුණි. මේ අතර සාමාන්‍ය අපනයන මිළ ගෙඩියකට විගැහි 0.09 දක්වා සියයට 29 කින් වැඩිවිය. පොල් අපනයනය කරන ප්‍රධාන රටක් වූ පිලිපීනයෙහි පොල් නිෂ්පාදනය තියුණු ලෙස පහත වැටීම ලෝක වෙළෙඳපොළේ පොල් නිෂ්පාදිත සැපයුම කෙරේ බලපෑවේය. කෙසේ වෙතත් පොල් අපනයන මිළ වැඩිවීම අපනයන ප්‍රමාණය අඩුවීමෙන් ඇති වූ අයහපත් ප්‍රතිඵල සමහන් කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය. මෙය අපනයන ඉපැයීම් අඩුවීමට හේතු විය. පොල් අතුරු නිෂ්පාදිතයන්ගෙන් ලැබුණ අපනයන ඉපැයීම්වල ද අඩුවීමක් වාර්තා විය. පොල් කෙඳි වගී අපනයනයන්ගේද පහත වැටීමක් වාර්තා විය.

## සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත

1991 දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අංශයේ ක්‍රියාකාරිත්වය තරමක දියුණුවක් පෙන්විය. සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන වටිනාකම 1990 විගැහි දශ ලක්ෂ 59 (රුපියල් දශ ලක්ෂ 3,199) සිට 1991 විගැහි දශ ලක්ෂ 60 (රුපියල් දශ ලක්ෂ 3,409) දක්වා සියයට 2 කින් වැඩි විය. කෙසේ වුවද, මුළු අපනයනවල සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතයන්හි දායකත්වය පසුගිය වර්ෂයේ මෙන් සියයට 4 මට්ටමෙහිම නොවෙනස්ව පැවතුණි. 1991 වසර තුල සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත ආදායමෙන් කුරුඳු වලින් පමණක් ලැබූ අපනයන ඉපැයීම් සියයට 42 ක් විය. සකස් නොකළ දුම්කොළ, ගම්මිරිස්, කෝපි, කජු, පුවක්, පළතුරු යනාදියෙන් ලත් අපනයන ඉපැයීම්වලද සැලකිය යුතු වැඩිවීමක් වාර්තා විය. කජු මද සහ සකස් නොකළ දුම්කොළ වලින් ලත් අපනයන ඉපැයීම් වැඩිවීමට ප්‍රධාන හේතුව

වූයේ ඒ සඳහා විදේශීය වෙළෙඳපොළෙහි වැඩි මිළක් ලැබීමය. මේ අතර කුරුඳු, ගම්මිරිස්, පළතුරු වලින් ලැබූ අපනයන ඉපැයීම් වැඩිවීමට හේතු වූයේ අපනයනය කරන ලද ප්‍රමාණය වැඩිවීමය.

**කාර්මික අපනයන**

1990 විගැහි දශ ලක්ෂ 763 (රුපියල් දශ ලක්ෂ 41,510) හා සසඳා බලන කල 1991 කාර්මික අපනයනවල වටිනාකම සියයට 17 ක වැඩිවීමක් වාර්තා කරමින් විගැහි දශ ලක්ෂ 896 (රුපියල් දශ ලක්ෂ 50,736) ක් විය. කාර්මික නිෂ්පාදිතයන්ගේ වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන්ගේ වර්ධනයයි. මෙම කාලපරිච්ඡේදය තුළදී රෙදිපිළි හා ඇඟළුම් අපනයන විගැහි දශ ලක්ෂ 462 සිට විගැහි දශ ලක්ෂ 588 දක්වා සියයට 27 කින් වැඩි වූ අතර හම් හා රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, ආහාර හා පාන වර්ග, දුම්කොළ වැනි වෙනත් කාර්මික නිෂ්පාදිත වටිනාකම සියයට දහයකින් වැඩි විය. මේ අතර 1991 වර්ෂයේ ඛණිජ තෙල් අපනයන වටිනාකම විගැහි දශ ලක්ෂ 73 සිට විගැහි දශ ලක්ෂ 58 දක්වා සියයට 21 කින් ද අඩු වූ අතර දියමන්ති අපනයනයන්ද විගැහි දශ ලක්ෂ 65 සිට විගැහි දශ ලක්ෂ 50 දක්වා සියයට 23 කින් අඩු විය.

**ඛණිජමය අපනයන**

පසුගිය වර්ෂයේ වැඩිදියුණුවක් පෙන් වූ ඛණිජමය අපනයන ඉපැයීම් 1990 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 64 (රුපියල් දශ ලක්ෂ 3,484) සිට 1991 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 45 (රුපියල් දශ ලක්ෂ 2,563) දක්වා සියයට 30 ක අඩුවීමක් වාර්තා කරමින් පසු බැමකට ලක් විය. මෙය වැඩි වශයෙන්ම පිළිබිඹු වූයේ විගැහි දශ ලක්ෂ 54 (රුපියල් දශ ලක්ෂ 2,933) සිට විගැහි දශ ලක්ෂ 42 (රුපියල් දශ ලක්ෂ 2,358) දක්වා සියයට 22 කින් අඩුවූ මැණික් අපනයනයෙනි. මෙම කාලපරිච්ඡේදය තුල ලෝපස්, යකඩ, යකඩ පයිරයිට්ස් සහ ස්වභාවික මිනිරන් ඇතුලත් වෙනත් ඛණිජ අපනයන වටිනාකම විගැහි දශ ලක්ෂ 10 සිට විගැහි දශ ලක්ෂ 4 දක්වා පහත වැටුණි.

**ආනයන***

ගලපන ලද රේගු සංඛ්‍යා අනුව, 1990 විගැහි දශ ලක්ෂ 1980 (රුපියල් දශ ලක්ෂ 107,729) හා සසඳා බලන කල 1991 දී මුළු ආනයන වියදම සියයට 13 ක වර්ධනයක් වාර්තා කරමින් විගැහි දශ ලක්ෂ 2,237 ක් (රුපියල් දශ ලක්ෂ 126,643) විය. මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන් අතිකුත් ආහාර ද්‍රව්‍ය සහ වෙනත් පාරිභෝගික භාණ්ඩ වැනි පාරිභෝගික භාණ්ඩ තුළින්ද, රෙදිපිළි හා ඇඟළුම්, කඩදාසි හා කඩදාසි බෝඩ් වැනි අන්තර් භාණ්ඩ තුළින්ද ප්‍රවාහන උපකරණ හා යන්ත්‍රසූත්‍ර වැනි ආයෝජන භාණ්ඩ තුළින්ද වාර්තා විය.

ආනයන සංයුතිය 1991 වර්ෂයේ තරමක් වෙනස් වූයේය. මෙම වර්ෂය තුලදී පාරිභෝගික භාණ්ඩවල දායකත්වය සියයට 22 සිට සියයට 24 දක්වා වැඩි වූ අතර අන්තර් භාණ්ඩවල දායකත්වය සියයට 52 සිට සියයට 51 දක්වා අඩු විය. පසුගිය වර්ෂයේ මෙන්ම 1991 වර්ෂයේද පාරිභෝගික භාණ්ඩවල දායකත්වය සියයට 26 ක මට්ටමෙහි නොවෙනස්ව පැවතුණි.

**පාරිභෝගික භාණ්ඩ**

පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන වියදම 1990 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 522 (රුපියල් දශ ලක්ෂ 28,420) සිට 1991 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 572 (රුපියල් දශ ලක්ෂ 32,357) දක්වා සියයට 10 කින් වැඩි විය. මෙම වැඩිවීම විශාල වශයෙන් පිළිබිඹු වූයේ සියයට 17 කින් වර්ධනය වූ වෙනත් පාරිභෝගික භාණ්ඩයේ වියදම් තුළිනි. ආහාර සහ පාන වර්ග සඳහා වූ වියදම සියයට 3 කින් සුළු වශයෙන් වැඩි විය. සහල්, පිටි සහ සීනි සඳහා වූ වියදම පහත වැටීම, ආහාර හා

* නැවත වර්ගීකරණය නිසා 1990 සඳහා වූ සංඛ්‍යා 1990 වාර්ෂික වාර්තාවේ පළ වූ සංඛ්‍යාවලට වෙනස් වේ.

## 1.40 සංඛ්‍යා සටහන

### ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණය 1989 - 1991

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | වටිනාකම විගැහි දශ ලක්ෂ | | | මුළු ආනයනවල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 (අ) | 1990(ඈ) | 1991 (ආ) | 1989 | 1990 | 1991 | 1989 | 1990 | 1991 |
| 1. පාරිභෝගික භාණ්ඩ | 20,962 | 28,420 | 32,357 | 453.8 | 522.2 | 571.6 | 26.1 | 26.4 | 25.6 |
| 1.1 ආහාර සහ පාන වර්ග | 13,136 | 15,624 | 16,749 | 284.4 | 287.1 | 295.9 | 16.4 | 14.5 | 13.2 |
| 1.1.1 සහල් | 3,397 | 1,758 | 1,589 | 73.5 | 32.3 | 28.1 | 4.2 | 1.6 | 1.3 |
| 1.1.2 පිටි | 175 | 1,387 | 1 | 3.8 | 25.5 | 0.0 | 0.2 | 1.3 | 0.0 |
| 1.1.3 සීනි | 4,326 | 5,173 | 5,139 | 93.7 | 95.1 | 90.8 | 5.4 | 4.8 | 4.1 |
| 1.1.4 වෙනත් ආහාර | 5,238 | 7,306 | 10,020 | 113.4 | 134.2 | 177.0 | 6.6 | 6.8 | 7.8 |
| 1.2 වෙනත් | 7,826 | 12,796 | 15,608 | 169.4 | 235.1 | 275.7 | 9.8 | 11.9 | 12.4 |
| 2. අන්තර් භාණ්ඩ | 45,255 | 55,757 | 64,265 | 979.8 | 1,024.6 | 1,135.2 | 56.4 | 51.8 | 50.7 |
| 2.1 ඛණිජ තෙල් | 8,376 | 14,372 | 12,887 | 181.3 | 264.1 | 227.6 | 10.4 | 13.3 | 10.2 |
| 2.2 පොහොර | 1,755 | 2,958 | 2,430 | 38.0 | 54.3 | 42.9 | 2.2 | 2.7 | 1.9 |
| 2.3 රසායනික ද්‍රව්‍ය | 2,117 | 4,754 | 3,643 | 45.8 | 87.3 | 64.3 | 2.6 | 4.4 | 2.9 |
| 2.4 තිරිඟු | 4,964 | 3,791 | 3,303 | 107.5 | 69.7 | 58.3 | 6.2 | 3.5 | 2.6 |
| 2.5 රෙදිපිළි හා ඇඟළුම් | 9,981 | 13,454 | 20,611 | 216.0 | 247.2 | 364.1 | 12.4 | 12.5 | 16.3 |
| 2.6 වෙනත් | 18,062 | 16,428 | 21,391 | 391.0 | 301.9 | 377.9 | 22.6 | 15.4 | 16.8 |
| 3. ආයෝජන භාණ්ඩ | 12,018 | 23,412 | 29,792 | 260.2 | 430.2 | 526.3 | 15.0 | 21.7 | 23.5 |
| 3.1 යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 6,278 | 9,885 | 11,881 | 135.9 | 181.6 | 209.9 | 7.8 | 9.2 | 9.4 |
| 3.2 ගමනාගමන උපකරණ | 1,833 | 4,537 | 7,607 | 39.7 | 83.4 | 134.4 | 2.3 | 4.2 | 6.0 |
| 3.3 ගොඩනැගිලි ද්‍රව්‍ය | 991 | 6,365 | 6,840 | 21.5 | 116.9 | 120.8 | 1.2 | 5.9 | 5.4 |
| 3.4 වෙනත් | 2,916 | 2,625 | 3,464 | 63.1 | 48.2 | 61.2 | 3.6 | 2.4 | 2.7 |
| 4. වර්ග නොකරන ලද | 1,990 | 139 | 229 | 43.1 | 2.5 | 4.0 | 2.5 | 0.1 | 0.2 |
| මුළු ආනයන (ඇ) | 80,225 | 107,729 | 126,643 | 1,736.9 | 1,979.5 | 2,237.1 | 100.0 | 100.0 | 100.0 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) ගලපන ලද.
(ඈ) නැවත වර්ගීකරණය නිසා 1990 සඳහා වූ සංඛ්‍යා 1990 වාර්ෂික වාර්තාවේ පළ වූ සංඛ්‍යාවලට වෙනස් වේ.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව: ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව: සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව: ලංකා පොහොර සංස්ථාව හා වෙනත් ප්‍රධාන පොහොර ආනයන කරුවෝ: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව: ශ්‍රී ලංකා මහ බැංකුව.

පාන වර්ග කාණ්ඩයේ ආනයන වල ප්‍රධාන ලක්ෂණයක් විය. මෙම දෙවර්ෂය තුල ආනයනය කල ප්‍රමාණය මෙට්‍රික් ටොන් 39,000 කින් අඩුවීමෙන් සහල් සඳහා වූ ආනයන වියදම 1990 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 32 (රුපියල් දශ ලක්ෂ 1,758) සිට 1991 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 28 (රුපියල් දශ ලක්ෂ 1,589) දක්වා සියයට 13 කින් අඩුවිය. 1990 වර්ෂයේ හත් ගුණයකින් පමණ වැඩිවූ තිරිඟු ආනයන 1990 වර්ෂයේ මෙට්‍රික් ටොන් 129,000 සිට 1991 වර්ෂයේ මෙට්‍රික් ටොන් 43,000 දක්වා අඩුවීමෙන් ආනයන ප්‍රමාණය ඉතා අඩු තත්වයකට පත් විය. කෙසේ වෙතත් තිරිඟු පිටි ආනයනයේ පහත වැටීම, දේශීය වශයෙන් පිටි නිෂ්පාදනය සඳහා වැඩි වශයෙන් තිරිඟු ඇට ආනයන, කිරීමෙන් තරමක් දුරට සමනය විය. සීනි ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 53,108 කින් වැඩි වුවද අන්තර් ජාතික වෙළෙඳපොළේ සීනි මිල අඩුවීම නිසා සීනි ආනයන වියදම 1990 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 95 (රුපියල් දශ ලක්ෂ 5,173) සිට 1991 විගැහි දශ ලක්ෂ 91 (රුපියල් දශ ලක්ෂ 5,139) දක්වා සියයට 5 කින් අඩුවිය.

ආහාර සහ පාන වර්ග කාණ්ඩයේ වැඩිවූ ආනයන වියදම ප්‍රධාන වශයෙන් කිරි හා කිරි නිෂ්පාදිත සහ වෙනත් ආහාර වර්ග සඳහා වූ වැඩිවීම පිළිබිඹු කරයි. කිරි හා කිරි නිෂ්පාදිත සඳහා වූ ආනයන වියදම 1990 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 44 (රුපියල් දශ ලක්ෂ 2,367) සිට 1991 විගැහි දශ ලක්ෂ 49 (රුපියල් දශ ලක්ෂ 2,796) දක්වා සියයට 14 කින් වැඩි වූ අතර වෙනත් ආහාර පාන සඳහා වූ වියදම මෙම දෙවර්ෂය තුල විගැහි දශ ලක්ෂ 59 (රුපියල් දශ ලක්ෂ 3,200) සිට විගැහි දශ ලක්ෂ 91 (රුපියල් දශ ලක්ෂ 5,135) දක්වා සියයට 54 කින් වැඩිවිය.

අනිකුත් පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයේ වැඩිවීමක් වාර්තා වූයේ ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර සහ සියයට 33 සිට 37 දක්වා වැඩි වූ වෙනත් පාරිභෝගික භාණ්ඩ තුලිනි. පිළිවෙලින් සියයට 25 කින් සහ සියයට 10 කින් අඩු වූ මෝටර්කාර් හා බයිසිකල් සහ ටයර් හා ටියුබ් ආනයනයන්හි අඩුවීමක් පිළිබිඹු විය.

## අන්තර් භාණ්ඩ

1991 අන්තර් භාණ්ඩ සඳහා වූ වියදම පසුගිය වර්ෂයට වඩා සියයට 11 ක වැඩිවීමක් පෙන්වමින් විගැහි දශ ලක්ෂ 1,135 (රුපියල් දශ ලක්ෂ 64,265) විය. ප්‍රධාන වශයෙන් රෙදිපිළි සහ ඇඟළුම් සඳහා වූ වියදම 1990 විගැහි දශ ලක්ෂ 247 (රුපියල් දශ ලක්ෂ 13,454) සිට 1991 විගැහි දශ ලක්ෂ 364 (රුපියල් දශ ලක්ෂ 20,611) දක්වා සියයට 47 කින්ද, වෙනත් අන්තර් භාණ්ඩ සඳහා වූ වියදම විගැහි දශ ලක්ෂ 302 (රුපියල් දශ ලක්ෂ 16,428) සිට විගැහි දශ ලක්ෂ 378 (රුපියල් දශ ලක්ෂ 21,391) දක්වා සියයට 29 කින් වැඩි විය. ඛණිජ තෙල්, පොහොර සහ රසායනික ද්‍රව්‍ය සඳහා වූ ආනයන වියදම් මේ වර්ෂයේ පිළිවෙලින් සියයට 14 කින්, සියයට 21කින් සහ සියයට 26 කින් පහත වැටුණ අතර, පසුගිය වසර හා සැසඳීමේදී මේ වියදම් සියයට 46 කින්, සියයට 43 කින් සහ සියයට 31 කින් වැඩි වූ බව පෙනේ. බොර තෙල් සඳහා වූ වියදම අඩු වූයේ ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 153,344 කින් අඩුවීම හා ගල්ෆ් අර්බුදය විසඳීම නිසා බොර තෙල් මිල අඩුවීම යන කරුණු දෙකෙහිම බලපෑම නිසාය. පොහොර සඳහා වූ ආනයන වියදම අඩුවීමට හේතු වූයේ ආනයනය කල ප්‍රමාණය මෙට්‍රික් ටොන් 146,082 කින් අඩුවීමය.

## ආයෝජන භාණ්ඩ

ආයෝජන භාණ්ඩ ආනයන වියදම 1990 විගැහි දශ ලක්ෂ 430 (රුපියල් දශ ලක්ෂ 23,412) සිට 1991 විගැහි දශ ලක්ෂ 526 (රුපියල් දශ ලක්ෂ 29,792) දක්වා සියයට 22 කින් වැඩි විය. මෙය වැඩි වශයෙන්ම පිළිබිඹු වූයේ 1990 විගැහි දශ ලක්ෂ 83 (රුපියල් දශ ලක්ෂ 4,537) සිට 1991 විගැහි දශ ලක්ෂ 134 (රුපියල් දශ ලක්ෂ 7,607) දක්වා සියයට 61 කින් වැඩි වූ ප්‍රවාහන

## 1.41 සංඛ්‍යා සටහන

### 1991 වර්ෂයේ ප්‍රධාන ආනයනයන්හි පරිමාව

මෙට්‍රික් ටොන්

| මාසය | සහල් | තිරිඟු | සීනි | බනිජ තෙල් (බොරතෙල්) | පොහොර |
|---|---|---|---|---|---|
| ජනවාරි | 19 | - | 18,370 | 126,147 | 46,251 |
| පෙබරවාරි | 10,940 | 52,080 | 34,089 | 87,502 | 7,630 |
| මාර්තු | 7,142 | 52,132 | 26,935 | 120,953 | 21,865 |
| අප්‍රේල් | 152 | 3,178 | 41,491 | 62,112 | 35,960 |
| මැයි | 46 | 104,527 | 29,959 | 170,282 | 12,100 |
| ජුනි | 11,873 | 57,185 | 26,500 | 128,109 | 13,515 |
| ජූලි | 102 | - | 38,486 | 61,802 | 13,100 |
| අගෝස්තු | 26,350 | 104,998 | 24,828 | 122,779 | 82,790 |
| සැප්තැම්බර් | 5,268 | 107,100 | 32,229 | 183,973 | 55,629 |
| ඔක්තෝබර් | 22,273 | 88,394 | 27,825 | 183,990 | 30,027 |
| නොවැම්බර් | 11,260 | 47,488 | 26,737 | 127,318 | 19,700 |
| දෙසැම්බර් | 37,537 | 52,500 | 30,983 | 250,555 | 20,020 |
| එකතුව (අ) | 132,962 | 669,582 | 358,432 | 1,625,522 | 358,587 |

(අ) ගලපන ලදී.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව:
සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව:
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සහ වෙනත්
ප්‍රධාන පොහොර ආනයන කරුවෝ.

උපකරණ සහ විගැහි දශ ලක්ෂ 182 (රුපියල් දශ ලක්ෂ 9,885) සිට විගැහි දශ ලක්ෂ 210 (රුපියල් දශ ලක්ෂ 11,881) දක්වා සියයට 16 කින් වැඩි වූ යන්ත්‍රසූත්‍ර ආනයන තුලිනි.

### අභ්‍යන්තර වෙළෙඳාම

1977 සිට අනුගමනය කරන ලද නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තීන්ට අනුගාමීව අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තිය භාණ්ඩ හා සේවාවන්හි තොග හා සිල්ලර වෙළෙඳ කටයුතුවල පුද්ගලික අංශයේ සහභාගීත්වය දිරිගැන්වීම කෙරෙහි යොමු කරන ලදී.

1987 අගෝස්තු මාසයේදී පිහිටුවන ලද සාධාරණ වෙළෙඳ කොමිසම විසින් ජාතික මිළ ප්‍රතිපත්තියක් සකස් කිරීමත් එය ක්‍රියාත්මක කිරීමත් මෙන්ම තරඟ කාරීත්වයට එරෙහි කටයුතු පාලනය කිරීම හා සම්බන්ධ කාර්‍යයන්හිද නිරත විණි. 1991 සිට බලපැවැත්වෙන පරිදි 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ විධිවිධාන අනුව 1987 අංක 1 දරණ සාධාරණ මිළ කොමිෂන් පනතට සිදුකළ සංශෝධන හේතුවෙන් එම කොමිසමේ කටයුතු සැළකිය යුතු ලෙස වෙනස් විය. ඒ අනුව, කොමිසම මගින් මීට ඉහත දී සිදු කරන ලද මිළ අධීක්ෂණ කටයුතු නවත්වන ලදී. කිරිඟු පිටි හා පාන්වලට අතිරේකව ඖෂධ වර්ග 1500 කට වඩා වැඩි ප්‍රමාණයක් 1991 දී මිළ පාලනය කරන ලද අයිතම කාණ්ඩයට ඇතුළත් කරන ලදී. කොමිසම මගින් අසාධාරණ මිළ වැඩිකිරීම් සම්බන්ධ වූ සිද්ධීන් පිළිබඳ පරීක්ෂණ පවත්වන ලදී. එපමණක් නොව, කොමිසමේ මූලික අරමුණ වන තරඟකාරීත්වයට එරෙහි කටයුතු වැලැක්වීම සම්බන්ධයෙන් කොමිසම මගින් ඒකාබද්ධවීම්/අත්පත් කරගැනීම් තුනක් පිළිබඳව හා එක් කොන්දේසිගත අලෙවියක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලදී.

සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවේ (ස.තො.ස.) කටයුතු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනයට

පමණක් ප්‍රධාන වශයෙන් සීමා විය. විශාල සම්භාරක තොග පවත්වාගෙන යාමට අමතරව, වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා ස.තො.ස. තැවත පිරවීමේ පදනම මතද තොග පවත්වාගෙන යනු ලැබීය. මීට අතිරේකව, ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල වූ එහි තාවකාලික මිළදී ගැනීමේ මධ්‍යස්ථානවලින් ද දේශීය කෘෂි නිෂ්පාදන ස.තො.ස. මිළදී ගන්නා ලදී.

ආර්.එස්.එස්. රබර් මිළදී ගැනීමේ නිරත වන වෙළෙඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුව, එම ක්ෂේත්‍රයේ මිළ තීරණය කරන නියෝජිත ආයතනය වශයෙන් වැදගත් කාර්ය භාරයක් නොකඩවා ඉටු කරන ලදී. ප්‍රධාන විදේශ වෙළෙඳපොළ වල මිළ ගණන් මත පදනම්ව, පෞද්ගලික වෙළෙඳුන්ට ආර්.එස්.එස්. රබර් මිළදී ගැනීමට මහ පෙන්වීමක් වශයෙන්, මිළ ගණන් දිනපතා තීරණය කරන ලදී. වෙළෙඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුව මගින් රබර් වගාකරන ප්‍රධාන ප්‍රදේශවල මිළදී ගැනීමේ මධ්‍යස්ථාන 14 ක් පවත්වාගෙන යන අතර ජාත්‍යන්තර වෙළෙඳපොළට යැවීම සඳහා රබර් සකස් කිරීම හා වර්ග කිරීම සඳහා කොළඹ මධ්‍යම ගබඩාවක් පවත්වාගෙන යනු ලබයි.

නිෂ්පාදනය, බෙදාහැරීම හා අලෙවිය සම්බන්ධව පාරිභෝගික දැනුම වර්ධනය කිරීමේ අරමුණ ඇතිව, අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් ස්වේච්ඡා හා ගම් පදනම මත පාරිභෝගික ආරක්ෂක සමිති පිහිටුවනු ලැබීය. ඒ අනුව, 1991 අවසානය වන විට සමිති 2,555 ක් ක්‍රියාත්මක විය. එපමණක් නොව, නව්‍යාත්මක ව්‍යාපෘතියක් වශයෙන්, පාරිභෝගික අධ්‍යාපන වැඩ සටහනක් ලෙස වසර තුළදී පාසැල් පාරිභෝගික ආරක්ෂණ සමිති 479 ක් පිහිටුවන ලදී.

## විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය

### තීරුබදු

ජාත්‍යන්තර වෙළෙඳ ද්‍රව්‍ය මිළ ගණන් පහත වැටීම කරණකොටගෙන, සහන සැළසීමේ පියවරක් ලෙස වතු අංශයේ නිෂ්පාදනවලට අදාල වූ අපනයන බදු වසර තුළදී පහත දමන ලදී. ඒ අනුව, තේ වටිනාකම මත පනවන ලද බදු සියයට 50 සිට සියයට 40 දක්වා අඩුකරන ලදී. 1991 මාර්තු මස සිදුකරන ලද සංශෝධනයන්ගෙන් පසු තොග තේ, පැකට් කළ තේ, තේ මළු හා ක්ෂණික තේ සඳහා අදාළ වූ බදු ප්‍රමාණයන් පිළිවෙළින් රු.1, ශත 50, ශත 25 හා රු.6/- වශයෙන් පැවතුණි. එමෙන්ම තේ අපනයන සෙස් බද්ද ද රු.3.50 සිට රු.2/- දක්වා 1991 ජූලි මසදී අඩු කරන ලදී. රබර් සඳහා වූ බදු අනුපාතයන් සියයට 50 සිට සියයට 30 දක්වා 1991 ඔක්තෝම්බර් මස පහත දමන ලදී. පොල්තෙල් මත පනවන ලද බදු සඳහා වූ නිදහස් සීමාව රු.25,000 සිට රු.20,000 දක්වා අඩු කරන ලද අතර, බදු අනුපාතයද සියයට 50 සිට සියයට 40 දක්වා අඩු කරන ලදී. කොප්පරා හා කපානු පොල් මත වූ අවම විශේෂ බද්ද ද මෙට්‍රික් ටොන් එකකට රු.1000 බැගින් අඩු කරන ලදී.

### ආනයන හා අපනයන පාලන

විශේෂ අයිතමයන් සමහරක් හැර බොහෝ වෙළෙඳ ද්‍රව්‍ය ආනයන අපනයන පාලක වෙතින් විශේෂ බලපත්‍රයක් ලබාගැනීමෙන් තොරව වර්තමානයේ ආනයනය කල හැක. වසර තුළදී ආනයන පාලන රෙගුලාසි සුළු වශයෙන් සංශෝධනය කරන ලදී. කෝස්ටික් සෝඩා ආනයන පාලන නීති වලින් නිදහස් කරන ලදී. පෞද්ගලික පරිහරණය සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ හා නිෂ්පාදන බැඳුම්කර ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සියයට සියයක් අපනයන අභිමුඛ කර්මාන්ත සඳහා ආනයන කරන අමුද්‍රව්‍ය, ණයවර ලිපි අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම 1991 දී නොකඩවා ක්‍රියාත්මක විය.

1991 දී ස්වාභාවික මිනිරන් බලපත්‍රයන්ගෙන් තොරව අපනයනය සඳහා ඉඩ දෙන ලදී. ඒ

අනුව, දැනට අයිතම 11 ක් පමණක් අපනයනය සඳහා ආනයන අපනයන පාලකගේ බලපත්‍ර ලබාගත යුතු වේ.

## ප්‍රවාහන ගාස්තු

1990 නැව් සේවා ලිහිල් කිරීමෙන් පසු නැව්ගත කරන්නන් අතර වූ තරඟය ඉහළයාමත් සමඟ, විශේෂයෙන් තේ හා ඇඟළුම් වැනි සමහරක් වෙළෙඳ ද්‍රව්‍ය සඳහා වූ ප්‍රවාහන ගාස්තු වසරේ මුල් මාස කිහිපය තුල අඛණ්ඩව පහත වැටිණි. කෙසේ වුවද, වසරේ අවසාන කොටස වන විට මෙම තැඹුරුව වෙනස් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයනය කරනු ලබන ඇඟළුම් සඳහා වූ ප්‍රවාහණ ගාස්තු සියයට 3 ත් සියයට 5 ත් අතර පරාසයකින් වැඩි වූ අතර, තේ සඳහා වූ ප්‍රවාහණ ගාස්තු සියයට 4 කින් වැඩිවිය. මීට අමතරව එක්සත් රාජධානිය හා අනිකුත් යුරෝපා රටවලට තේ හා ඇඟළුම් සඳහා වූ ප්‍රවාහණ ගාස්තු පිළිවෙලින් සියයට 4 කින් හා සියයට 2 කින් වැඩිවිය. 1991 තුළදී එක්සත් රාජධානිය හා අනිකුත් යුරෝපා රටවලට කපාපු පොල් සඳහා වූ ප්‍රවාහන ගාස්තු සියයට 16 කින් හා සියයට 11 කින් වැඩි විය.

## අපනයනයන්ට දිරි දීම්

අපනයනාභිමුඛ වර්ධනය දිරිගැන්වීමේ උපාය මාර්ගයේ මූලිකාංගයක් ලෙස සම්ප්‍රදායික නොවන අපනයන දිරිමත් කිරීමේ විශේෂ අවධානය සහිතව විවිධ මූල්‍යමය, රාජ්‍යමය හා අනිකුත් ආයතනමය සහයෝගයන් හා සේවාවන් අපනයනකරුවන්ට ලබාදීම 1991 වසර තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක විය.

අපනයන අංශයෙන් සම්පත් වෙනතකට යොමුවීම වැලැක්වීමේ අරමුණ ඇතිව ආනයන තරඟකාරී අංශයට නැතහොත් අපනයන අංශයට පැවති ඵලදායී ආරක්ෂණය, 1991 නොවැම්බර් මසදී සිදු වැදැරුම් තීරු බදු ක්‍රමයක් හඳුන්වාදීමෙන් තවදුරටත් අඩු කරන ලදී. මීට අමතරව, රුපියල් මිලියන 10 ක අවම ආයෝජනයක් ඇති සමහරක් දේශීය කර්මාන්තවලට සිය නිමැවුමෙන් සියයට 90 කට වඩා අපනයනය කළ යුතුය යන කොන්දේසිය මත මහ කොළඹ ආර්ථික කොමිසමේ (ම.කො.ආ.කො.) සහන හා ප්‍රතිලාභ ප්‍රදානය කරන ලදී. කෘෂිකාර්මික භෝගයන් සම්බන්ධයෙන් අවම අපනයන මට්ටම සියයට 75 කි. පස් අවුරුදු බදු විරාමය, තීරුබදුවලින් තොරව ද්‍රව්‍ය යන්ත්‍ර හා උපකරණ ආනයනය විදේශ විනිමය ණය, විදේශ විනිමය ගිණුම් පවත්වාගෙන යාමට අනුමැතිය හා පොදු කාර්යය පහසුකම් සැලසීම ම.කො.ආ.කො. යටතේ පිරිනමනු ලබන දිරිගැන්වීම් අතර වේ. මීට අමතරව, අපනයන සංවර්ධන මණ්ඩලය, බදු ප්‍රතිදාන ක්‍රමය, නිෂ්පාදන බැඳුම්කර ක්‍රමය, යන්ත්‍ර උපකරණ තීරු බදු රහිතව වරායෙන් ලබාගැනීමට සැලැස්වීම වැනි රාජ්‍ය මූල්‍යමය දිරිගැන්වීම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මගින් අපනයන කරුවන්ට සහය දෙන ලදී. විමසුමට භාජනය වන වසර තුළදී සමාගම් අනුව, ඇඟළුම් හා නිෂ්පාදන සඳහා බදු ප්‍රතිදාන අනුපාතිකයන් 373 ක් බදු ප්‍රතිදාන කොමිසම මගින් නියම කරන ලදී. අපනයන සංවර්ධන බැංකුව නිෂ්පාදන බැඳුම්කර ක්‍රමය යටතේ සහතිකපත් 100 ක් ද බදු රහිතව යන්ත්‍ර උපකරණ ලබාගැනීමේ යෝජනාක්‍රමය යටතේ (තීරු බදු නිදහස් යෝජනාක්‍රමය) සහතික පත් 1,186 ක් ද නිකුත් කරන ලදී.

1991 ඔක්තෝම්බර් සිට බලපැවැත්වෙන පරිදි, තේ අපනයන කරුවන්ට අක්වෙරළ බැංකු පහසුකම් ලබාගැනීමට ඉඩ සලසන ලද අතර මෙය පසුව ආනයන අවශ්‍යතාවයන් මූල්‍යකරණය කිරීමේ අරමුණ සඳහා අනිකුත් අපනයන කරුවන් වෙත ද දීර්ඝ කරන ලදී. ඒ අනුව, තේ අපනයන කරුවනට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වෙතින් මාස තුනක කාලයක් සඳහා ඉන්වොයිස් වටිනාකමින් සියයට 75 ක් දක්වා සිය පූර්ව නැව්ගත අවශ්‍යතාවයන් සඳහා ණය පහසුකම් ලබගත හැක. මීට අතිරේකව, සිය අපනයන ඇණවුම් සපුරාලීම සඳහා අවශ්‍ය විදේශීය යෙදවුම් ආනයනය, මූල්‍යකරණය කිරීමේ අරමුණ සඳහා සියලුම අපනයන කරුවන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වෙතින් ණය ලබා ගැනීමට සුදුස්සන් කරන ලදී.

අපනයන සංවර්ධන හා ආයෝජන උපකාරක යෝජනාක්‍රමය (අ.ස.ආ.උ.යෝ), ක්‍රියාකාරිත්වය මත පදනම් වූ මූල්‍යකරණ ක්‍රමයක් ලෙස 1991 දී ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමය යටතේ, අපනයනයන්ගේ වටිනාකමින් ප්‍රතිශත පදනමක් මත ගෙවීම් සිදු කරන ලදී. මෙම ගෙවීම්වලින් සියයට 75 ක් අපනයන සංවර්ධන මණ්ඩලය මගින් පිළිගත්, අපනයනයට නැඹුරුවූ ව්‍යාපෘති වෙනුවෙන් මුදල් කළ හැකි සහතිකපත් ආකාරයෙන් විය. මෙම යෝජනාක්‍රමය යටතේ 1991 දී රුපියල් මිලියන 244 ක වටිනාකමක් දක්වා මුදලින් ගෙවීම් කරන ලදී.

අපනයනයට නැඹුරුවූ සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට මූල්‍ය ආධාර සැපයීමේ අරමුණ ඇතිව අපනයන සංවර්ධන බැංකුව මගින් සියයට 7 ක සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. මේ යෝජනාක්‍රමය මගින් එක් ව්‍යාපාරිකයකුට රුපියල් ලක්ෂයක උපරිමය දක්වා ණය ලබාදෙන අතර, 1991 දී ව්‍යාපෘති 14 ක් සඳහා මෙම යෝජනාක්‍රමය මගින් ප්‍රතිලාභ ලබා දී ඇත.

## වෙළෙඳ සැකසුම්

වෙළෙඳ ප්‍රමුඛතා පිලිබඳ ජගත් වැඩපිළිවෙලට සහභාගි වන රටවල් සංඛ්‍යාව 1991 දී 36 ක් දක්වා වැඩිවිය. දියුණුවන රටවලට සිය රටවල් අතර වෙළෙඳාම දියුණු කිරීම සඳහා වූ මෙම ගිවිසුම යටතේ, සාමාජික රටවලින් ආනයනය කරන අයිතමයන් 24 ක් සඳහා ප්‍රමුඛතා බදු සැලකිළි ලබාදීමට ශ්‍රී ලංකාව එකඟ වූ අතර, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන අයිතමයන් 23 ක් සඳහා ඒ හා සමාන සැලකිළි ලැබීමට ශ්‍රී ලංකාවට හැකිවනු ඇත. ප්‍රමුඛතා පිළිබඳ පොදු වැඩපිළිවෙල හා බැංකොක් ගිවිසුම යටතේද ශ්‍රී ලංකාව බදු ප්‍රමුඛතා සැලකිළි භුක්තිවිඳීම නොකඩවා කරනු ලැබිය. සමහර වර්ගයේ රෙදිපිළි නිෂ්පාදිත අපනයන විධිමත් කිරීම සඳහා 1988 ජුනි 22 වන දා සිට පිළියෙල කරනු ලැබූ ශ්‍රී ලංකා - ස්වීඩන් ද්විපාර්ශවික ගිවිසුම, ස්වීඩන රජය මගින් රෙදිපිළි ආනයනය ලිහිල් කිරීමෙන් පසුව 1991 අගෝස්තු පළමුවැනිදා සිට ක්‍රියා විරහිත විය. ජාත්‍යන්තර රබර් ගිවිසුම හා යෝජිත ජාත්‍යන්තර තේ ගිවිසුම සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් වසර තුළදී නොවීය.

## වෙළෙඳ සම්බන්ධතා

ආර්ථික සහයෝගීතාව සඳහා වූ ශ්‍රී ලංකා පාකිස්ථාන් ඒකාබද්ධ කමිටුවේ පස්වන සැසිවාරය, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව සඳහා වූ ශ්‍රී ලංකා මාලදිවයින් ඒකාබද්ධ කමිටුවේ 3 වන සැසිවාරය හා වෙළෙඳාම හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ ශ්‍රී ලංකා බංග්ලාදේශ ඒකාබද්ධ කමිටුවේ 2 වන සැසිවාරය වසර තුළදී පැවැත්විණි. මෙම සැසිවාරයන්හි දී ශ්‍රී ලංකාව හා අනිකුත් රටවල් අතර පවතින ද්විපාර්ශික වෙළෙඳාම විමසුමට ලක්කළ අතර, මෙම රටවල් අතර පවතින ආර්ථික සහයෝගීතාව ඉහළ නැංවිය හැකි ආකාරයන් සාකච්ඡාවට භාජනය කරන ලදී. ශ්‍රී ලංකාව හා පාකිස්ථානය අතර පැවති රැස්වීමේදී පාකිස්ථානයේ ද්‍රව්‍ය මිළට ගැනීම සඳහා ඇ.එ.ජ.ඩොලර් මිලියන 5 ක ප්‍රමාණයක ණය සඳහා ණය ගිවිසුමකට අත්සන් තබන ලදී. 1991 ජූලි මස ශ්‍රී ලංකා ඉන්දියා ඒකාබද්ධ කොමිසම පිහිටුවන ලද අතර ඒ යටතේ වෙළෙඳාම, මූල්‍යකරණය හා ආයෝජනය සඳහා වූ ශ්‍රී ලංකා ඉන්දියා උප කොමිසමේ පළමු සැසිවාරය 1991 ඔක්තෝම්බර් මසදී රැස්විණි. ඊජිප්තුව සමඟ පවතින ද්විපාර්ශික වෙළෙඳතුලන ප්‍රශ්ණය විසඳීම සඳහා වසර තුළදී ශ්‍රී ලංකාව ඊජිප්තුව සමඟ පොස්පේට් මිළට ගැනීම සඳහා ගිවිසුමට අත්සන් කරන ලදී.

## සංචාරක කර්මාන්තය

1990 වසර තුළදී සැලකිය යුතු ලෙසින් යථා තත්ත්වයට පත් වූ සංචාරක කර්මාන්තය විමසුමට ලක්වූ වසර තුළදීද අඛණ්ඩව ප්‍රසාරණය විය. 1991 වර්ෂයේ 317,703 ක් වූ මුළු සංචාරක පැමිණීම් 1990 ට වඩා සියයට 7 ක වැඩිවීමක් වාර්තා කළේය. විමර්ශණයට ලක්ව ඇති වර්ෂය තුළදී සංචාරකයන් විසින් ගත කරන ලද රාත්‍රී සංඛ්‍යාව 3,336,000 ක් වෙමින් සියයට 9 ක වාර්ෂික වර්ධනයක් පිළිබිඹු කළේය.

1991 වර්ෂයේදී ආසියාව හැරුනුකොට සියළුම ප්‍රධාන කලාපයන්ගෙන් වූ සංචාරක පැමිණීම් වර්ධනයක් වාර්තා කළේය. පසුගිය වසරේ සියයට 57 හා සසඳා බලන කල මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 60 කට දායක වූ බටහිර යුරෝපය, විසින් අතීතයේ මෙන්ම ප්‍රධාන වෙළෙඳපොළ වශයෙන් අඛණ්ඩව පැවතුණි. 1991 දී, 192,054 ක් වූ බටහිර යුරෝපයෙන් වූ සංචාරක පැමිණීම් 1990 ට වඩා සියයට 13 ක වර්ධනයක් වාර්තා කළේය. ඔස්ට්‍රියාව, ස්පාඤ්ඤය හා ඉතාලිය හැරුණුකොට, අනිකුත් සියලුම ප්‍රධාන බටහිර යුරෝපීය රටවලින් සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද 1990 මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 34 ක් දෙවන විශාලම වෙළෙඳපොළ වන ආසියාතු වෙළෙඳපොළින් වූ සංචාරක පැමිණීම්, 1991 මුළු පැමිණීම්වලින් සියයට 30 දක්වා පහත වැටිණි. 1990 සියයට 53 ක සිත්ගන්නා සුළු වර්ධනය හා බලන කල, ප්‍රධාන වශයෙන් හොංකොං (සියයට 70), සිංගප්පූරුව (සියයට 20), තායිලන්තය (සියයට 13) හා ඉන්දුනීසියාව (සියයට 11) යන රටවලින් සංචාරකයන්ගේ පැමිණීම අඩුවීම හේතුකොට ගෙන ආසියාතු කලාපයෙන් වූ සංචාරක පැමිණීම් 1991 දී සියයට 3 කින් අඩු විය. මේ අතර

**1.42 සංඛ්‍යා සටහන**

**සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛණ 1990 - 1991**

| ශීර්ෂය | 1990 | 1989 ට වඩා ප්‍රතිශත වෙනස | 1991 | 1990 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් | 297,888 | +61.3 | 317,703 | + 6.7 |
| 2. පැය 24 ට අඩු කාලයකට රට තුල රැදෙන විදේශික මගීන්ගේ පැමිණීම් | 3,954 | - 2.7 | 2,665 | -32.6 |
| 3. සංචාරක දින (රාත්‍රී) ගණන (දහස්) | 3,068 | +55.7 | 3,336 | + 8.7 |
| 4. සංචාරකයින්ගෙන් දළ ලැබීම් | | | | |
| 4.1 රුපියල් දශ ලක්ෂ | 5,143 | +87.7 | 6,463(අ) | +25.7 |
| 4.2 එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ | 129 | +69.7 | 156 | +20.9 |
| 4.3 විශුහි දශ ලක්ෂ | 93 | +56.8 | 114 | +22.6 |
| 5. පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | | | | |
| 5.1 විනෝදය | 277,722 | +63.2 | 310,714 | +11.9 |
| 5.2 ව්‍යාපාරික කටයුතු | 15,250 | +29.5 | 5,719 | -62.5 |
| 6. කලාප අනුව පැමිණීම් ගණන | | | | |
| 6.1 බටහිර යුරෝපය | 169,294 | +66.1 | 192,054 | +13.4 |
| 6.2 ආසියාව | 100,004 | +52.8 | 96,654 | - 3.3 |
| 6.3 උතුරු ඇමරිකාව | 8,084 | +38.3 | 9,615 | +18.9 |
| 6.4 නැගෙනහිර යුරෝපය | 7,562 | +66.4 | 4,755 | -37.1 |
| 6.5 ඕස්ට්‍රලේසියාව | 8,914 | +121.7 | 9,747 | + 9.3 |
| 6.6 වෙනත් | 4,030 | +34.9 | 4,878 | +21.0 |
| 7. මුළු සේවා නියුක්තිය | 60,000 | +25.0 | 64,800(අ) | + 8.0 |
| 7.1 සෘජු | 25,000 | +25.0 | 27,000 | + 8.0 |
| 7.2 වක්‍ර | 35,000 | +25.0 | 37,800 | + 8.0 |

(අ) තාවකාලික.

මූලයන් : ලංකා සංචාරක මණ්ඩලය:
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඕස්ට්‍රේලියාවෙන් හා උතුරු ඇමෙරිකාවෙන් සංචාරක පැමිණීම් පිළිවෙලින් සියයට 9 කින් හා 19 කින් වර්ධනය විය. මේ අතර, නැගෙනහිර යුරෝපීය රටවල දේශපාලනික වෙනස්වීම් සමඟ එක්වූ ආර්ථික ප්‍රශ්නවල බලපෑම පිළිබිඹු කරමින් එම කලාපයෙන් වූ සංචාරක පැමිණීම් වසර තුළදී සියයට 37 ක සැළකියයුතු පහළ බැසීමක් වාර්තා කළේය. 1991 දී සංචාරක කර්මාන්තයෙන් ලද දළ විදේශ විනිමය ඉපැයීම් පසුගිය වසරට වඩා සියයට 26 (විගැහි අනුව සියයට 23) ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 6,463 (විගැහි දශ ලක්ෂ 114) ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත.

1991 දී සංචාරක කර්මාන්තය මගින් සපයන ලද මුළු රැකියා අවස්ථාවන් ගණන 64,800 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර මෙය පෙර වසරට වඩා සියයට 8 ක වැඩිවීමකි. මින් 27,000 ක් පමණ සංචාරක කර්මාන්තයේ කෙළින්ම සේවා නියුක්තව සිටින අතර, ඉතිරි 37,800 අනුබද්ධ අංශවල සේවා නියුක්තව ඇත.

ශ්‍රේණිගත නවාතැන් අංශයේ හෝටල් ඒකක සංඛ්‍යාව 1990 දී 120 සිට 1991 දී 122 දක්වා පුළුල් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු කාමර ධාරිතාව 1990 වර්ෂයේ 9,556 සිට 1991 වර්ෂයේ 9,679 දක්වා සියයට එකකින් ආන්තික වැඩිවීමක් පෙන්විය. මේ අතර ශ්‍රේණිගත නවාතැන් අංශයේ කාමර උපයෝගීකරණ අනුපාතිකය 1990 සියයට 47 සිට 1991 සියයට 48 දක්වා ආන්තික වශයෙන් වැඩිවූ අතර, අතිරේක නවාතැන් අංශයේ ඒකක සංඛ්‍යාව වර්ෂ දෙක ඇතුළත දී 96 සිට 109 දක්වා වැඩි විය.